# විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය - 2020

## *පර්යේෂණ යෝජනා කැඳවීම 2020 - දෙවන අදියර*

රටේ වර්තමාන තත්වය සැලකිල්ලට ගනිමින් මෙම වසර සඳහා දෙවන වරටත් විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය (SRPC) සඳහා පර්යේෂණ යෝජනා කැඳවීමට ජාතික විද්‍යා පදනම තීරණය කර ඇත.

පාසලේ විද්‍යා ගුරුවරයාගේ හෝ වැඩිහිටියෙකුගේ මඟ පෙන්වීම යටතේ සිසුන්ට නිවසේදී හෝ පාසලේදී පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම අපේක්ෂා කෙරේ. ඔබ කණ්ඩායම් පර්යේෂණ ව්‍යාපෘතියක් කිරීමට අදහස් කරන්නේ නම්, එක් එක් කණ්ඩායම් සාමාජිකයින්ට ව්‍යාපෘතියේ කොටසක් හෝ ව්‍යාපෘතියේ ප්‍රතිගුණනය තමන්ගේ නිවසේදීම සිදු කර පසුව ඒවායේ ප්‍රතිඵල ඒකාබද්ධ කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. ඔබේ ව්‍යාපෘති යෝජනාව තරඟයට තෝරාගත් පසු පර්යේෂණය සඳහා අවශ්‍ය විශේෂඥ උපදෙස් ලබා දීම සඳහා ජාතික විද්‍යා පදනම සුදුසු පර්යේෂකයෙක් සමග ඔබව සම්බන්ධ කරනු ඇත. ඔබගේ ව්‍යාපෘතිය මාස 4-6 ක කාල සීමාවකදී සිදු කළ යුතු අතර, රටේ වර්තමාන සෞඛ්‍යය තත්වය අනුව අවම අධීක්ෂණය හා අවම රසායනාගාර පහසුකම් යටතේ සිදු කළ හැකි පර්යේෂණයක් සැලසුම් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

**<u>නිර්ණායක</u>**

1. වයස් සීමාව:
   i. අවුරුදු 13-20 (2021 මැයි 01 දිනට හෝ ඊට පෙර වයස අවුරුදු 20 සම්පූර්ණ නොවිය යුතුය)
   ii. 9-12 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන්
2. සිසුන්ට මෙය කේවල පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස හෝ කණ්ඩායම් ව්‍යාපෘති ලෙස කළ හැකිය.
   a. කණ්ඩායමේ සියලුම සාමාජිකයින් ඉහත වයස් සීමාව තුළ සිටිය යුතුය.
   b. කණ්ඩායම් ව්‍යාපෘති සඳහා උපරිම සාමාජිකයන් 03 ක් විය යුතුය.
3. ඔබට පහත දැක්වෙන පුළුල් ක්ෂේත්‍රයන්හි අදාල ඕනෑම විද්‍යා ක්ෂේත්‍රයක පර්යේෂණ ව්‍යාපෘතියක් ඉදිරිපත් කල හැක.
   - ශාක විද්‍යාව
   - පසු අස්වනු තාක්ෂණය
   - සෞඛ්‍යය සේවා උපකරණ
   - ජෛවීය සහ පාරිසරික විද්‍යාව
   - පාරිසරික ඉංජිනේරු විද්‍යාව (උදා: වැසි ජලය එක්රැස් කිරීම / ජීව වායු ආදිය)
   - නව කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම
   - දේශීය දැනුම ආශ්‍රිත කෘෂිකර්මාන්ත හා වෙනත් පර්යේෂණ
   - චර්යා හා සමාජ විද්‍යා
   - ගණිතය
4. විද්‍යාගාර ආදර්ශන, පුස්තකාල පර්යේෂණ, ආකෘති හා ඉගැන්වීම් කට්ටල නිර්මාණය කිරීමේ ව්‍යාපෘති මේ සඳහා පිළිගනු නොලැබේ.
5. වර්තමාන සෞඛ්‍යය තත්වය සැලකිල්ලට ගනිමින්, අදාල සෞඛ්‍යය නිර්දේශ අනුගමනය කරමින්, පුද්ගල අන්තර් ක්‍රියා අවම මට්ටම භාවිතා කළ හැකි ව්‍යාපෘති යෝජනාවක් සැලසුම් කිරීම සිදු කරන්න.
6. එක් ශිෂ්‍යයෙකුට සහභාගී විය හැක්කේ එක් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා පමණි.

7. ජාතික විද්‍යා පදනමේ අනුමැතිය ඇතිව සම්බන්ධ කරගන්නා ලද පර්යේෂකයෙකුගේ මග පෙන්වීම යටතේ දෙමාපියන් / වැඩිහිටියන්ගේ අධීක්ෂණය යටතේ සිසුන් විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. ඔබේ පර්යේෂණ කටයුතු සිදුකරන අතරතුර සියලු සෞඛ්‍යය හා අනිකුත් ආරක්ෂක පියවර අනුගමනය කළ යුතුය.
8. ව්‍යාපෘති කාල සීමාව : මාස 06 ට අඩු විය යුතු අතර 2020 ජනවාරි මාසයට පෙර ආරම්භ කළ ව්‍යාපෘති ඇතුළත් නොකළ යුතුය.
9. ව්‍යාපෘති යෝජනා සිසුන් විසින් සකස් කර නියමිත දින (2020 අගෝ 15) හෝ ඊට පෙර ජාතික විද්‍යා පදනම වෙත (විද්‍යුත් තැපැල මගින් maduka@nsf.gov.lk/abhimani@nsf.gov.lk ) ලැබීමට සලස්වන්න. කරුණාකර විද්‍යුත් තැපැලෙහි විෂය "SRPC 2020- 2nd Call" ලෙස දක්වන්න.
10. ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් පවත්වනු ලබන සියලුම ප්‍රගති සමාලෝචන වැඩමුළුවලට සහභාගී වීම අනිවාර්ය වේ (රටේ පවතින තත්වය අනුව එය සංවිධානය කෙරේ).
11. ව්‍යාපෘතිය අවසන් වූ පසු සාරාංශයක් සහ ව්‍යාපෘති වාර්තාවක් ජාතික විද්‍යා පදනම වෙත ඉදිරිපත් කළ යුතුය.
12. ශිෂ්‍යයන් තම ව්‍යාපෘති ජාතික විද්‍යා පදනම විසින් පත් කරන ලද විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. එය පියවර දෙකකින් පවත්වනු ලැබේ (රටේ පවතින සෞඛ්‍යය තත්වය අනුව මෙම ඇගයීමේ ක්‍රමය වෙනස් විය හැක).

    - පියවර I : බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම ( Multimedia Presentation)
    - පියවර II: පෝස්ටර් ඉදිරිපත් කිරීම

13. තරඟයේ අවසාන තීරණය විනිශ්චය මණ්ඩලයේ තීරණය වන අතර ජයග්‍රාහකයින් තෝරාගත් පසු අභියාචනා සැලකිල්ලට ගනු නොලැබේ.
14. ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරනු ලබන උත්සවයකදී ජයග්‍රාහකයින්ට මුදල්, පලක සහ සහතික ප්‍රදානය කරනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා පහත නිලධාරීන් සම්බන්ධ කර ගන්න.

මදුකා සේනාරත්න හෝ අභිමානි රණතුංග, විද්‍යාත්මක නිලධාරීන්, විද්‍යා ප්‍රචලිත කිරීමේ අංශය, ජාතික විද්‍යා පදනම (දුරකථන: 011-2696771 දිගුව 183/184)

ආචාර්ය පී.ආර්.එම්.පී. දිල්රුක්ෂි,
අංශ ප්‍රධානී,
ජාතික විද්‍යා පදනම,
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7.
දුරකථන: 011 2209509; 011 2696771 දිගුව 180
විද්‍යුත් තැපැල: dilrukshi@nsf.gov.lk

සටහන: ඔබ දැනටමත් SRPC- 2020 පළමු අදියර පර්යේෂණ යෝජනා කැඳවීම සඳහා යෝජනාවක් මේ වනවිටත් ඉදිරිපත් කර ඇත්නම් කරුණාකර එය නව නිර්ණායකයන්ට අනුව සකසා නැවත ඉදිරිපත් කරන්න.